ජාතික ජන බලවේගය
தேசிய மக்கள் சக்தி
JATHIKA JANA BALAWEGAYA (NPP)

සභාපති,

සීමාසහිත ස්වාධීන රූපවාහිනී සේවය,

වික්‍රමසිංහපුර,

බත්තරමුල්ල.

සභාපතිතුමනි,

**යෝජිත රූපවාහිනී සංවාදය පිළිබඳවයි**

2024.06.04 දාතමින් ඔබ විසින් ජාතික ජන බලවේගයේ නායක අනුර කුමාර දිසානායක සහෝදරයා අමතමින් එවන ලද ලිපිය හා බැඳේ.

එම ලිපිය මගින් අප පක්ෂයේ නායක අනුර කුමාර දිසානායක සහෝදරයා සහ සමගි ජන බලවේගයේ නායක සජිත් ප්‍රේමදාස මහතා අතර 2024.06.06 වැනි දින පැවැත්වීමට නියමිත විවාදය සඳහා ඔබ ආයතනයේ රූපවාහිනී නාලිකාව මගින් පහසුකම් සැලසීමට ඉදිරිපත් වීම පිළිබඳව ස්තුතිය පළ කරමු.

ඒ අනුව එම දිනයේදී අදාළ විවාදයට අනුර කුමාර දිසානායක සහෝදරයා සහභාගි වීමට සූදානමින් සිටින බව මෙයින් දැනුම් දෙමු. කෙසේ වුවද මෙය සාමාන්‍ය රූපවාහිනී සංවාදයක් නොව දැනටමත් ප්‍රකාශිත විවාදයක් වන බැවින් ප්‍රතිපාර්ශ්වය වන සමගි ජන බලවේගයේ නායකයා ලෙස සජිත් ප්‍රේමදාස මහතා ඊට සහභාගි වන්නේද යන්න පිළිබඳව තහවුරු කර ගත යුතුව ඇත.

එබැවින් ඒ මහතා අදාළ දිනයේ යොදා ඇති වේලාවට සහභාගි වන බව දැනුම් දී ඇත්දැයි කඩිනමින් අප වෙත දැනුම් දීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

ස්තුතියි,

වෛද්‍ය නලින්ද ජයතිස්ස

ජාතික ජන බලවේගය

2024.06.05
071 8100605